# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2249/14 – 2021 ඔක්තෝබර් මස 13 වැනි බදාදා – 2021.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 204 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/19/2001/E/351.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/3/10/229.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 11 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, අත්තනගල්ල.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 328 ඩී, තල්ගස්මොටේ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තල්ගස්මොටේ ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක ගම 3732 හා 2010.03.22 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – ගොරකගහලන්ද – ප්‍රමාණය: හෙක්. 1.2298**
උතුරට: මාර්ගය, වයි. පී. දිසානායක, ඩබ්. ඒ. ජයමාන්න, ඩබ්. ඒ. පීටර්, එන්. පී. එන්. ජයලාල්, එන්. එම්. ලීලාරත්න හිමිකම් කියන දෙල්ගහවත්ත, එන්. එම්. නෙත්තසිංහ, එන්. පී. සෝමාවතී හිමිකම් කියන ගොඩඋඩවත්ත සහ ඇළ; නැගෙනහිරට: ඇළ, කේ. ඒ. අප්පුහාමි, එන්. එම්. ගුණදාස, කේ. ඒ. එම්. සිල්වා හිමිකම් කියන ගොරකගහලන්ද; දකුණට: පී. පිරිගල, ඊ. සිල්වා හිමිකම් කියන ගොරකගහලන්ද, මාර්ගය සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: මාර්ග (මා.සං.අ.), මාර්ගය, එච්. ඒ. සිරිසේන හිමිකම් කියන ගොරකගහලන්ද සහ මාර්ගය.

10 – 403